# බන්ධනාගාර මූලස්ථානය

## சிறைச்சாலைத் தலைமையகம்

## PRISON HEADQUARTERS

150, බේස්ලයින් පාර, කොළඹ 09. 150, பேஸ்லைன் வீதி,கொழும்பு 09. 150, Baseline Road, Colombo-09

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner - General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|


| මගේ අංකය<br>எனது இல.<br>My No | ඩී16/විභාග/විවෘත/2019 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2021.01. 18 |
|---|---|---|---|---|---|

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වූ
යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2019 සඳහා සුදුසුකම් ලබා ඇති,
පරීක්ෂණය සඳහා සහභාගී වීමට නොහැකි වූ සියළු අයදුම්කරුවන්ගේ අවධානයට,

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමක / කාන්තා නියාමක තනතුරට<br>බඳවා ගැනීම සඳහා වූ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2019</u>**

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගයෙන් හා දරාගැනීමේ හැකියාව උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් වූවන් හට යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය 2020.12.28 , 2020.12.29, 2020.12.30 තෙදින දිවයින පුරා මධ්‍යස්ථාන 06 කදී පැවැත්විණ.

02. එම සම්මුඛ පරීක්ෂණය පැවති දින වලදී, පවතින කොවිඩ් 19 වසංගත තත්වය මත පනවා ඇති සංචරන සීමා නිසා හෝ කැඳවීම් ලිපි නොලැබීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට නොහැකි වූ අයදුම්කරුවන් හට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය ඇමුණුම 01 හි සඳහන් කැඳවීම් ලිපි ආකෘතියේ පරිදි පැවත්වීමට කටයුතු යොදා ඇති අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ සියළු අයදුම්කරුවන් හට තැපැල් මගින් කැඳවීම් ලිපි යොමු කර ඇත.

03. එමගින් දන්වා ඇති පරිදි යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන ලෙස දන්වන අතර, පරීක්ෂණයට ඉදිරිපත් වීමට නැවත දිනයක් ලබා නොදෙන බව වැඩි දුරටත් දන්වමි.

චන්දන ඒකනායක
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

ඇමුණුම 01

කැඳවීම් ලිපිය - ආකෘති පත්‍රය


# බන්ධනාගාර මූලස්ථානය
## சிறைச்சாலைத் தலைமையகம்
## PRISON HEADQUARTERS

150, බේස්ලයින් පාර, කොළඹ 09. 150, பேஸ்லைன் வீதி, கொழும்பு 09 150, Baseline Road, Colombo-09

| දුරකථන / தொலைபேசி / Telephones | කාර්යාලය / அலுவலகம் / Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල් / ஆணையாளர் நாயகம் / Commissioner - General | 2691976 | කොමසාරිස් / ஆணையாளர் / Commissioner | 2695221<br>2692818 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|


| මගේ අංකය / எனது இல / My No | ඩී16/විභාග/විවෘත/2019 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2021.01. |
|---|---|---|---|---|---|

**Mr / Mrs / Ms : (නම)** (කැඳවීම් අංකය)

(ජා.හැ.අංකය)

**<u>ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමක / කාන්තා නියාමක තනතුරට</u>**
**<u>බඳවා ගැනීම සඳහා වූ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2019</u>**

උක්ත සම්මුඛ පරීක්ෂණය 2020.12.28 , 2020.12.29 , 2020.12.30 යන දින දිවයින පුරා මධ්‍යස්ථාන 06 කදී පවත්වන ලදී.

02. එම සම්මුඛ පරීක්ෂණය පැවති දිනයේදී, පවතින කොවිඩ් 19 වසංගත තත්වය මත පනවා ඇති සංචරන සීමා නිසා හෝ කැඳවීම් ලිපි නොලැබීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට නොහැකි වූ අයදුම්කරුවන් හට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පහත පරිදි පැවත්වීමට කටයුතු යොදා ඇත.

i. පැවැත්වෙන දිනය : 2021.01.27
ii. පැවැත්වෙන වේලාව : (අයදුම්කරු වෙත තැපැල් මගින් යොමු කර ඇති කැඳවීම් ලිපියේ දක්වා ඇත)
iii. පැවැත්වෙන ස්ථානය : බන්ධනාගාර මූලස්ථානය - කොළඹ 09.

03. ඔබට සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය මේ වන තෙක් ලැබී ඇත්නම් එපරිදි සියළු ලිපි ලේඛන රැගෙන ආ යුතු අතර, කැඳවීම් ලිපිය මේ වන තෙක් ලැබී නොමැති නම් **www.prisons.gov.lk** වෙබ් අඩවියට පිවිස කැඳවීම් ලිපියේ ආකෘති පත්‍රයක් ලබා ගත හැක.

04. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු සහතික (මුල් පිටපත් රැගෙන ආ යුතුය):

i. ජාතික හැඳුනුම්පත්‍රය හෝ වලංගු ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය
ii. උප්පැන්න සහතිකය
iii. ග්‍රාම සේවා සහතිකය (මාස 03 ක් ඇතුලත ලබා ගන්නා ලද සහතිකයක් විය යුතුය)
iv. පාසල හැරයාමේ සහතිකය
v. අධ්‍යාපන සහතික - අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ලේඛන
vi. නමේ වෙනසක් ඇතිනම් දිවුරුම් ප්‍රකාශ / උපැවිදි සහතික

05. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන අනෙකුත් සහතික හා ලේඛන (මුල් පිටපත් රැගෙන ආ යුතුය.)

i. අ.පො.ස. (උ.පෙළ) සහතිකය
ii. ලබා ඇති අනෙකුත් උසස් අධ්‍යාපන සහතික (උපාධි සහතික)
iii. හදාරා ඇති ඩිප්ලෝමා / පරිගණක හෝ වෙනත් පාඨමාලා / වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලා සහතික
iv. රියදුරු බලපත්‍රය
v. ශිෂ්‍ය භට / ශිෂ්‍ය භට (තූර්ය වාදක) / බාලදක්ෂ හා අවි පුහුණුව ලබා ඇති නම් එම සහතික
vi. ක්‍රීඩා සහතික (මව්රට නියෝජනය/ ජාතික මට්ටමින්/ පළාත් මට්ටමින්/ දිස්ත්‍රික් මට්ටමින් /ප්‍රාදේශීය, කලාප, පාසල් මට්ටමින් )

vii. දහම් පාසල් අවසන් සහතිකය/ ධර්මාචාර්ය විභාග සහතිකය/ දහම් පාසල් 8 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සමත් වී තිබීම.

viii. ශිෂ්‍ය නායක සහතික

ix. සමාජ සේවා සහතික (ස්වේච්ඡා සංවිධාන වල දැරූ තනතුරු, සංවිධානය කළ විශේෂ සමාජ සේවා වැඩසටහන් සහතික මඟින් සනාථ කළ යුතුය.)

06. සියළුම සහතික වල මුල් පිටපත් ගොනුවක ඉහත පිළිවෙලට තබා රැගෙන ආ යුතුය.

07. තවද, ඉහත පරිදි ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛන වල සහ සහතිකපත් වල, ඔබ විසින්ම අත්සන් කර සත්‍යතාවය සනාථ කල කරන ලද ඡායා පිටපත් ඇතුළත් ගොනුවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු බව දන්වන අතර, එය වෙනම ගොනුවක් ලෙස සකස් කර ගෙන පැමිණිය යුතු වේ. ( ගොනු කවරයේ ඔබගේ නම , කැඳවීම් අංකය, සම්මුඛ පරීක්ෂණය දිනය සඳහන් කරන්න.)

08. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට නැවත දිනයක් ලබා නොදෙන බව වැඩි දුරටත් දන්වමි.

එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්